# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION

සුහුරුපායසෙ , බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 2058/2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திகதி / Date — 01/08/2024 පැය 1350

## මාධ්‍ය නිවේදනය

**පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු**

**01. තහනම් දුම්කොළ මිශ්‍ර මාවා සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා තලවකැලේ කඳවුර**

2024.07.31 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා තලවකැලේ කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් දිඹුලපතන පොලිස් වසමේ කොටගල ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර තහනම් දුම්කොළ මිශ්‍ර මාවා ග්‍රෑම් 33 මිලි ග්‍රෑම් 390 ක් සන්තකයේ තබාගත් සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන දිඹුලපතන පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 29 ක් වූ කොටගල ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

දිඹුලපතන පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**02. අයිස් මත්ද්‍රව්‍ය හා හෙරොයින් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා රත්ගම කඳවුර.**

2024.07.31 වන දින රාත්‍රි කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා රත්ගම කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් රත්ගම පොලිස් වසමේ වැටලීමක් සිදු කර අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 150 මිලි ග්‍රෑම් 797 ක්, හෙරොයින් ග්‍රෑම් 51 මිලි ග්‍රෑම් 292ක් හා ජංගම දුරකථනයක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන රත්ගම පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 31 ක් වූ අංහන්දිය, රත්ගම ප්‍රදේශයේ පදිංචිකාරුවෙකු වේ.**

රත්ගම පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**